සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

නම : .............................................. නාට්‍ය හා රංග කලාව කාලය : පැය 02 යි.

සැළකිය යුතුයි :

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

---

## I කොටස

(1) ''අමර ගියා දිව්‍ය ලෝකෙ'' නාට්‍යයේ තේමාව වන්නේ,
- (i) අමර පාසල් නොයාමට ගන්නා උත්සාහය.
- (ii) වැරදි මතයක පිහිටා කටයුතු කළ අමර නිවැරදි මාවතට ගැනීම.
- (iii) අමර විසින් දිව්‍ය ලෝකෙ සැප සම්පත් භුක්ති විඳීම.
- (iv) අමර ඉතා ඉක්මනින් රැවටෙන සුළු වීම.

(2) නම්‍යශීලී ශරීරයක් ඇති කර ගැනීම සඳහා මෙම අභ්‍යාසය වැදගත් වේ.
(i) ශ්වසන අභ්‍යාස (ii) කටහඬ අභ්‍යාස (iii) දර්පණ අභ්‍යාස (iv) ශිථිලකරණ අභ්‍යාස

(3) මේවා අතරින් වේදිකා නාට්‍ය ගීතයක් වන්නේ,
(i) පිපි කුසුම වදුළු සිඹිමින් (ii) හිත පුරාම ඩෙගා නටන
(iii) අන්න බලන් සඳ (iv) මිදුලේ වැලි මාළිගාවෙ

(4) 'මකුට' යනුවෙන් හඳුන්වන්නේ
(i) පාවහන් ය. (ii) ඔටුනු ය. (iii) වෙස් මුහුණු ය. (iv) රැවුල් ය.

(5) නූර්ති නාට්‍ය රඟ දැක් වූ රංග භූමිය වන්නේ,
(i) තානායම් පොළ (ii) කමත (iii) කරලිය (iv) ප්‍රොසිනියම් වේදිකාව

- **නොගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(6) අමරගියා දිව්‍ය ලෝකේ නාට්‍යයේ දැකිය හැකි නාට්‍යමය අවස්ථාවක් වන්නේ,
(i) දොස්තර මාමාගේ උපක්‍රමය (ii) බෙහෙත් විදීම
(iii) වී කරලක් ඇහිදගෙන ඒම (iv) දිව්‍ය ලෝකයේ සැප සම්පත් භුක්ති විඳීම

(7) ක්ෂණික නිරූපණයක දක්නට ලැබෙන ලක්ෂණයකි.
(i) පිටපතක් තිබීම (ii) කෙටිකාලයකින් ඉදිරිපත් කිරීම
(iii) පරිකල්පන ශක්තිය (iv) පෙර සූදානමක් නොමැති වීම

(8) වේෂ භූෂණවලට අයත් වේ.
(i) සාරිය (ii) කොස්ස (iii) මාලය (iv) සපත්තු

(9) තාපන අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන වන්නේ,

(i) ක්‍රියාශීලි වීම (ii) මනා කටහඬක් ඇති කර ගැනීම

(iii) සබකෝලය දුරු කර ගැනීම (iv) රංගනය සඳහා පෙර සූදානමක් ඇති කර ගැනීම

(10) ගැමි නාට්‍යවලට අයත් වේ.

(i) නාඩගම් (ii) සොකරි (iii) නූර්ති (iv) කෝලම්

● **පහත ප්‍රහේලිකාව දී ඇති ප්‍රශ්න ඇසුරින් සම්පූර්ණ කරන්න.**




**හරහට**

(11) නළුවකු තමන්ගේ චරිතය අතහැර වෙනත් චරිතයකට පිවිසීම මේ නමින් හඳුන්වයි.

(12) නාට්‍යයක් පුහුණුවීමට පෙර නළු නිළියන් විසින් කරනු ලබයි.

**පහළට**

(13) නාට්‍යයකින් ප්‍රකාශ වන ප්‍රධාන පණිවිඩය මේ නමින් හඳුන්වයි.

(14) මිනිසා කුඩා කල සිටම කරනු ලබන දෙයකි.

(15) නාට්‍ය පිටපතක අඩංගු වේ.

● **ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| (16) | පරිකල්පනය යනු | රඟපෑමයි |
| (17) | ශබ්ද උත්පාදනය කළ හැක | රසවත් සිදුවීම් |
| (18) | කතන්දරයක දක්නට ලැබේ | රංග අභ්‍යාස |
| (19) | රූපණය යනු | බඩට තට්ටු කිරීමෙන් |
| (20) | කායික මානසික සමබරතාවය ඇති කර ගැනීමට කරනු ලබයි | අලුතින් යමක් සිතීමයි |

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න ගණන 3කි)**

01. පහත සඳහන් දෙබස් ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අමර : ඔව් මං අම්මා කියන දේ අහල හොඳට ඉගෙන ගන්නවා. ආයෙ මං මැරෙන්නෙත් නෑ. ආයෙ නං මෙහෙ එන්නෙත් නෑ.

සුරංගනාවියෝ : එහෙනං දූන් ඇඳට ගිහිල්ලා නිදාගෙන ඇස් දෙක පියාගන්න.

අමර : අපේ ගෙදර යන්න (සතුටින්)

සුරංගනාවියෝ : ඔව්...

(වේදිකාව අඳුරු වේ)

(i) මෙම සංවාදය ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?

(ii) එම නාට්‍යය රචනා කළ රචකයා කවුරුන් ද?

(iii) මෙහි එන රංග විධාන නම් කරන්න.

(iv) මෙම නාට්‍යයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(v) මෙහි එන නාට්‍ය රචකයා නිර්මාණය කළ වෙනත් නාට්‍ය දෙකක් නම් කරන්න. (2 × 5 = 10)

02. (i) අභිනය යනු කුමක් ද? (ලකුණු 2)

(ii) සතර අභිනය නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබ නැරඹූ නාට්‍යයක සතර අභිනය භාවිතා කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

03. (i) ආනුෂංගික කලා යනු කුමක් ද? (ලකුණු 2)

(ii) ආනුෂාංගික කලාවලට අයත් කලා ප්‍රභේද නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබ පංති කාමරයේ දී නිර්මාණය කළ ආනුෂංගික කලාවක රූප සටහනක් ඇඳ එය නිර්මාණය කළ ආකාරය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

04. (i) අභිරූපණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ii) මෙහිදී මූලික කරගන්නා ප්‍රධාන අභින දෙක මොනවා ද? (ලකුණු 3)

(iii) අභිරූපණ රංගනයක දැකිය හැකි විශේෂ ලක්ෂණ මොනවා ද? (ලකුණු 5)

05. (i) ඔබ දන්නා ඓතිහාසික කතාවක් ඇසුරින් නාට්‍ය පෙළක් රචනා කරන්න. (රංග විධාන සහ නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම පිළිබඳ සැලකිලිමත් වන්න.) (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | (ii) | (6) | (iii) | (11) | සමාරෝපය | (16) | අලුතින් යමක් සිතීමයි. |
| (2) | (iv) | (7) | (i) | (12) | රංග අභ්‍යාස | (17) | බඩට තට්ටු කිරීමෙන් |
| (3) | (iii) | (8) | (ii) | (13) | තේමාව | (18) | රසවත් සිදුවීම් |
| (4) | (ii) | (9) | (ii) | (14) | අනුකරණය | (19) | රඟපෑමයි |
| (5) | (iv) | (10) | (iii) | (15) | සංවාද | (20) | රංග අභ්‍යාස |

(ලකුණු 1 × 20 = ලකුණු 20කි)

## II කොටස

01. (i) අමර ගියා දිව්‍යලෝකේ නාට්‍ය
 (ii) පාලිත ලොකුපෝතාගම
 (iii) සතුටින්, වේදිකාව අඳුරු වේ
 (iv) කම්මැලි නොවිය යුතුය.
 දෙමාපියන්ගේ බසට අවනත විය යුතුයි. ආදී ලෙස ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
 (v) නෙලුම් කුමාරි, නුවන්ගේ මිතුරෝ හත්දෙනා, කපුටා සහ කේජු කැල්ල, රූප පෙට්ටිය, සල්ලි
 (2 × 5 = 10)

02. (i) ඉදිරියට පැමිණවීම (ලකුණු 2)
 (ii) ආංගික අභිනය, වාචික අභිනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය (ලකුණු 3)
 (iii) ගැළපෙන ලෙස පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

03. (i) නාට්‍යයක් සාර්ථක කරගැනීම සඳහා වේදිකාවට බැහැරින් යොදා ගන්නා සියලු කලාවන් (ලකුණු 2)
 (ii) සංගීතය, පසුතල, රංග වස්ත්‍ර, රංග ආභරණ, ආලෝකය, රංග භාණ්ඩ (ලකුණු 3)
 (iii) රූප සටහනක් ඇඳ ඒ පිළිබඳව විස්තර ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

04. (i) වචන භාවිතයෙන් තොරව මිනිස් සිරුර උපයෝගී කරගෙන කිසියම් සිද්ධියක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම. (ලකුණු 2)
 (ii) ආංගික අභිනය හා සාත්වික අභිනය (ලකුණු 3)
 (iii) අවකාශ සීමිතයි, විශේෂ අංග රචනා ක්‍රමයක් භාවිතා කරයි, කාලය සීමිතයි, ඇඟට ඇලෙන සුළු කළු හෝ සුදු වර්ණයෙන් යුතු ඇඳුම් භාවිතය, අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරයි, භාණ්ඩ භාවිත නොකරයි.
 (ලකුණු 5)

05. රංග විධාන හා නාට්‍යෝචිත අවස්ථා ගොඩනඟා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 7 - 2019**

නාට්‍ය හා රංග කලාව - ප්‍රායෝගික පරීක්ෂණය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.**

01. වේදිකා නාට්‍ය ගීතයක් ගායනය කරමින් රංගනය කරන්න. (ලකුණු 10)

02. ඔබ කැමති අභිරූපණ රංගනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

03. පහත සඳහන් වචන අර්ථ තුනක් වන සේ උච්චාරණය කරන්න. (ලකුණු 10)
මට බෑ, අඩන්න එපා, ඇයි යන්නෙ, එයා ගියාද? අනේ පව්.

04. ගුරුවරයා අභිමත පරිදි සිසුන් කණ්ඩායම් කර අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍ය පිටපතෙන් කොටසක් රංගනය කරවන්න. (ලකුණු 20)